**පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් - 2022/ 2023**
**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් ("සමාගම ") හි 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ ව මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින්ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව ;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව ;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව සමාගම ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇතිබව;

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවර්තන ණය සඳහා වෙන් කිරීම් ගණනය කිරීමේදී, හිඟ දින ගණන (days past due) පද්ධතිය තුල නොමැති වීම හේතුවෙන් ණය සම්බන්ධ වෙන්කිරීම සඳහා ගනුදෙනුකරුගේ ණය ශේෂයේ වයස පදනම් කර තිබුණි. ගනුදෙනුකරුගේ ණය ශේෂයේ වයස, සමස්ත හිඟ මුදල මත පදනම් වන හෙයින් එමඟින් තත්‍ය ණය හිඟ දින ගණන පෙන්නුම් නොකෙරේ. | සටහන් කර ගන්නා ලදී. පද්ධති සංවර්ධනය තුලින් ණය හිඟ දින ගණනය කිරීමට කඩිනමින් බලාපොරොත්තු වන්නෙමු. කෙසේ වෙතත්, අතින් ගණනය කරන ලද හිඟ දින ගණන මඟින් සියලු විධිමත්භාවයන් ආවරණය කෙරේ. | ණය හිඟ දින ගණන නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය අනුව බදු පෙර ලාභය රු. 67,050,781 ක් වූ අතර පෙර වසරේ අනුරූප ලාභය රු. 276,623,242 කි. එමනිසා , මූල්‍ය ප්‍රතිඵලයේ රු . 209,572,461 පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීමට හේතු ලෙස ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වියදම රු . 158,378,342කින් අඩුවුවද පොලී වියදම රු . 329,378,473 දක්වා ඉහල යාම හා ගාස්තු හා කොමිස් ආදායම් රු . 37,760,450 කින් අඩුවීම දැක්විය හැක.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

2.2.1 සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | **2022/2023** | **2021/2022** | **2020/2021** | **2019/2020** | **2018/2019** |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු .) | 765,081,162 | 793,186,355 | 819,027,057 | 795,054,678 | 676,325,915 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | (3.54) | (3.16) | 3.02 | 17.55 | |
| පොලී වියදම (රු .) | 514,286,414 | 184,907,941 | 218,015,318 | 265,159,407 | 240,935,082 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | 178.13 | (15.19) | (17.78) | 10.05 | |
| බදු පෙර ලාභය (රු .) | 67,050,781 | 276,623,242 | 202,056,281 | 48,974,530 | 87,443,094 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | (75.76) | 36.90 | 312.57 | (43.99) | |

2.2.2 සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා , වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනයේ වටිනාකම වැඩිවීම/(අඩුවීම) (රු .) | විචලනයේ % | විචලනයට හේතු |
|---|---|---|---|
| පොලී වියදම | 329,378,473 | 178.13 | පොලී අනුපාත ඉහල යාම නිසා පොලී වියදම වැඩිවී ඇත. පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ්හි සියලු දිගු කාලීන ණය සඳහා පොලිය සේම අයිරා පහසුකම් සැපයෙන්නේ විචල්‍ය අනුපාතයටය. 2021/2022 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2022/2023 මූල්‍ය වර්ෂය තුල වෙළඳපොල පොලී අනුපාත වේගවත් ලෙස ඉහළ යාම හේතුවෙන් පොලී වියදම් විශාල ලෙස ඉහළ ගොස් ඇත. (2021/22 තුල 7.93%-10.21% හා 2022/23 තුල 11.77%-33.09% ). |
| ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වියදම | (158,378,342) | (348.20) | සමාගමේ ණය එකතු කිරීම 2021/22 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2022/23 මූල්‍ය වර්ෂය තුල වේගවත් විය. ඒ හේතුවෙන් හිඟ මත අලාභයන් අඩු වීම හා හිඟ හිටීමේ සම්භාවිතාව අඩුවී ඇත. |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (29,091,657) | (20.29) | අනෙකුත් මෙහෙයුම් වියදම්වල ප්‍රධාන සංරචක ලෙස ලිපිද්‍රව්‍ය , කොමිස් සහ ව්‍යාපාරයට අදාළ ප්‍රවර්ධන වියදම් ආදි ව්‍යාපාරයට සම්බන්ධ වියදම් ඇතුලත් වේ. රටේ ආර්ථික අර්බුදය හා වාහන ආනයනය සීමා කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය මත ඇතිවූ අවිනිශ්චිතතාව හේතුවෙන් ව්‍යාපාර කප්පාදු කිරීමේ සමූහ ප්‍රතිපත්තියට අනුව සමාගමේ මුදාහැරීම් දැඩි ලෙස අඩු විය. (සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ ලියාපදිංචි නොකළ බයිසිකල් හා ත්‍රි රෝද රථයි ). 2021/22 මූල්‍ය වර්ෂයේ රු.මිලියන 1,757 ක් වූ මුදාහැරීම් 2022/23 මූල්‍ය වර්ෂයේදී රු.මිලියන 716 ක් විය. |
| ගාස්තු හා කොමිස් ආදායම් | (37,760,450) | (59.98) | ගාස්තු හා කොමිස් ආදායම් සෘජුව ව්‍යාපාර මට්ටම /මුදාහැරීම් හා සම්බන්ධ වේ. 2022/23 මූල්‍ය වර්ෂයේ සමස්ත මුදාහැරීම් රු.මිලියන 716 වූ අතර 2021/22 මූල්‍ය වර්ෂයේදී එය රු. මිලියන 1,757 කි . එම නිසා මුදාහැරීම් අඩුවීම හේතුවෙන් ව්‍යාපාරයට සම්බන්ධ ගාස්තු හා කොමිස් මුදල් ආදායම් දැඩි ලෙස අඩු වී ඇත. |
| පොලී ආදායම් | (28,105,193) | (3.54) | සමාගමේ හා සමූහයේ ප්‍රතිපත්තිය මත මුදාහැරීම් දැඩිව කපා හැරීම හේතුවෙන් පොලී ආදායම අඩු වී ඇත. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ වැදගත් අනුපාත පහත වගුවේ දැක්වේ.

| විස්තරය | 2022/2023 | 2021/2022 |
| --- | --- | --- |
| ශුද්ධ ලාභ අනුපාතය | 8.48% | 22.99% |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 13.08% | 37.96% |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 2.54% | 6.41% |
| ණය හිමිකමට අනුපාතය | 4.14 | 4.92 |